ශීර්ෂය - 215 කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

**ශීර්ෂය** 215 - **කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර්** 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 06 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යයසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ සිට වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු , පළාත් පාලන ආයතන වෙත ස්ථාන මාරු වී ගිය , මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කල, සේවය අතහැර ගිය හා සේවය අවසන් කල නිළධාරීන් 59 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.4,595,847 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී නිළධාරීන් 90 දෙනෙකුගේ ණය වර්ෂය තුළ නිරවුල් කර ඇති අතර 2022 දෙසැම්බර් 31 දිනට නිරවුල් කිරීමට ඉතිරි වූ නිළධාරීන් සංඛ්‍යාව 59 ක් බව. | අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

**පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල බැදීම් හා බැරකම් ප්‍රකාශනයේ දැක්වෙන ශේෂයන් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයේ දැක්වෙන ශේෂයන් සමග සැසදීමේදී වැය විෂයයන් 29 ක රු.882 සිට රු.32,943,562 ක් දක්වා වූ පරාසයක වෙනස්කම් පැවතුණි. | සිගාස් වැඩසටහනට බැරකම් ඇතුළත් කිරීමට ලබා දී තිබූ අවසාන දිනට පසුව ගිණුම් අංශයට බැරකම් ලෙස දන්වා එවා ඇති අගයන් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කර ඇති නමුත් සිගාස් වැඩසටහනේ ඇතුළත් කර නොමැති බව. | සියලු බැරකම් නියමිත දිනට භාණ්ඩාගාරයට වාර්තා කල යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල එකතුව රු.706,952 ක් වටිනා බැරකම් 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වවුචර්වල අඩුපාඩු හා අක්මුදල් නොමැතිවීම මත මෙම බැරකම් පවතින බව. | බැරකම් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

## 2.3 තැන්පත් ශේෂයන්

**පහත සදහන් නිරික්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු ගිණුම් 03 හි සමාලෝචිත වර්ෂය අවසානයට අවුරුදු 2 ඉක්මවූ රු.21,513,909 ක තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීම සඳහා අදාල අංශ දැනුවත්කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහනේ ii අදියර ක්‍රියාත්මක කිරීම සඳහා 2020 වර්ෂයේදී නිපුණතා සංවර්ධන අමාත්‍යංශයෙන් ලද රු.2,382,541 ක් අදාල කාර්ය ඉටු කිරීමකින් තොරව පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන පැවතුණි. | තව දුරටත් සැපයිය යුතු සේවාවන් සඳහා ඉතිරි වූ මුදල තැන්පත් ගිණුමේ රඳවා තබා ගෙන ඇති බව. | අදාල කටයුතු කඩිනමින් ඉටු කල යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 396 (ඇ) හි (iii) ප්‍රකාරව චෙක්පත් නිකුත් කල දින සිට මාස 6 ක් ඉක්මවා තිබූ එකතුව රු.628,626 ක් වූ චෙක්පත් 05ක් ගෙවන්නාට ඇති ණයක් වශයෙන් සටහන් කිරීම වෙනුවට පොදු තැන්පතු ගිණුමට මාරුකර තිබුණි. | රු.628,626 ක ශේෂ ඉදිරියේ දී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.4 බැංකු ගිණුම් මෙහෙයවීම

**පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තාක්ෂණ / කාර්මික විද්‍යාල 12 ක හා දෙපාර්තමේන්තු බැංකු ගිණුමට අදාලව නිකුත් කල එහෙත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 06 ඉක්මවූ එකතුව රු.254,619 ක් වූ චෙක්පත් 35ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉතිරි ශේෂ වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු ගිණුම හා කාර්මික හා තාක්ෂණ විද්‍යාල 03කට අයත් බැංකු ගිණුම් වලට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශවල 2021 අගෝස්තු සිට අවස්ථා 46 කදී පැවත එන එකතුව රු.116,175 ක් වූ හඳුනා නොගත් ලැබීම් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල වටිනාකම් හදුනා ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හඳුනා ගැනීම් කඩිනමින් සිදුකර අදාල ගිණුම් වලට ගිණුම්ගත කලයුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේදී ඩොලර් 7,373 ක් වටිනා එන්නත් කටු හා කුඩා ළමුන්ගේ රුව සහිත ඇසුරුම් ඇති බෙහෙත් වර්ග ඇතුලු පරිභෝජන ද්‍රව්‍ය කොරියානු ණය ආධාර මත ගම්පහ කාර්මික විද්‍යාලය වෙත ලබාදී තිබූ අතර ඒවා වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව යෙදවීමට ව්‍යාපෘති නිලධාරීන් කටයුතු කර නොමැති වීම හේතුවෙන් 2022 නොවැම්බර් 28 වන විට කල් ඉකුත්ව තිබුණි.<br><br>තවද ඉහත ව්‍යාපෘතිය යටතේ පරිගණක විද්‍යාගාර 1 හා 2 හි පරිගණක ජාල ගත කරමින් මධ්‍යගත පාලනයක් ඇති කිරිම සඳහා රු. මිලියන 8 ක වියදමින් පිහිටුවන ලද සේවාදායක පද්ධතිය (SERVER SYSTEM) විධිමත් ලෙස ක්‍රියා නොකරන බැවින් ස්ථාපිත කිරීමේ අරමුණු ඉටු වී නොතිබුණි. | මෙම ව්‍යාපෘතියේ කාර්යයන් සියල්ලම නිපුණතා අමාත්‍යාංශය මගින් සිදුකර ඇති බව. | නිපුණතා අමාත්‍යාංශයෙන් කාර්ය ඉටු කලද අවශ්‍යතාවයක් නොමැති නම් භාණ්ඩ ප්‍රතික්ෂේප කල යුතුව තිබුණි. මෙම කාර්යයට අදාලව සිදුවූ පාඩුව සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 25 ක් කඩිනමින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ රත්මලාන කාර්මික විද්‍යාලය සඳහා 2020 දෙසැම්බර් මස රු.295,520 කට මිලදී ගෙන තිබූ භාණ්ඩ වර්ග 03ක ඒකක 77 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පරිහරණය සඳහා යොදවා නොතිබුණි. | මෙම ව්‍යාපෘතියේ කාර්යයන් සියල්ලම නිපුණතා අමාත්‍යාංශය මගින් සිදුකර ඇති බව. | අවශ්‍යතාවයකින් තොරව භාණ්ඩ ලබා ගැනීම හා ලබාදීම පිළිබඳ සොයා බලා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව හා කාර්මික/තාක්ෂණ විද්‍යාල වල ඇප ලබා ගත යුතු නිලධාරින් එම තනතුරට පත්කල දින සිට මාස 2ක් ඇතුලත ඇප ලබාගත යුතු වුවද කිසිදු නිලධාරියෙකුගෙන් ඇප ලබා ගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛයක් නිකුත් කර නොමැති බැවින් අමාත්‍යාංශය වෙත අවශ්‍ය උපදෙස් පතා ලිපි යොමුකර ඇති බව. | ඇප තැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 පාඩු හා හානි**

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නිසි ක්‍රියාමාර්ග නොගෙන 2012 වර්ෂයේ සිට පවතින එකතු වටිනාකම රු.4,438,909 ක් වූ හානි හා පාඩු 2022 දෙසැම්බර් 31 දිනටද ඉදිරියට ගෙන ගොස් තිබුණි . | පාඩු හා හානි කපා හැරීම සඳහා අවසන් නියෝග ලැබී නොමැති අතර නියෝග ලැබූ පසු ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | පාඩු හා හානි සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2012 සැප්තැම්බර් 27 දින අම්පාර හාඩි තාක්ෂණ විද්‍යාලයේ අධ්‍යක්ෂතුමා විද්‍යාලයට අයත් වෑන් රථයක් පදවමින් සිටියදී හදිසි අනතුරකට ලක්වීම හේතුවෙන් රු.1,047,899 ක අලාභයක් සිදුවී තිබුණි.<br><br>මේ සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණ වලට අනුව රු.327,468 ක වන්දියක් පමණක් අධ්‍යක්ෂතුමාගෙන් අයකර ගැනීමට නිගමනය වී තිබුණි. එසේ වුවද 2023 වර්ෂය දක්වාම එම මුදල අයකර රජයේ ආදායමට බැර කිරීම වෙනුවට රු.1,000,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසානයට කපා නොහල හානි පාඩු ලෙස ගිණුම් වල පෙන්වා තිබුණි. | අදාළ නිළධාරියා අමාත්‍යාංශ ලේකම් වෙත කරන ලද ඉල්ලීමක් මත සදහන් කරුණු ද සැලකිල්ලට ගෙන විගණන විමසුමේ ඔහුට ගෙවීමට නියම කරන ලද අලාභයෙන් යම් ප්‍රතිශතයක් ගෙවීමට නිර්දේශ ලබා දී ඇත. මු.රෙ. ප්‍රකාරව නියෝග ලැබූ වහාම පොත් වලින් කපා හැරීමට කටයුතු කරන බව. | මේ අනතුර හේතුවෙන් රජයට සිදු වී ඇති අලාභය අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.4 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෝමාගම කාර්මික විද්‍යාලයේ මෝටර් යාන්ත්‍රික පාඨමාලාව හදාරන සිසුන්ගේ ප්‍රායෝගික පුහුණුව සඳහා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය (SSDP) යටතේ Wheel Alignment උපකරණ සවි කිරීම සඳහා විද්‍යාලය පිහිටි භූමියේ ස්වභාවය පරීක්ෂා කිරීමකින් තොරව 2016 වර්ෂයේදී රු.365,204 ක් වැයකර ඉදිකර තිබූ වාහන වලට (Vehical Pit) භූගත ජලය කාන්දුවීම හේතුවෙන් සිසුන්ට ප්‍රායෝගික පරීක්ෂණ කිරීමට නොහැකිවීම නිසා 2022 අගොස්තු 16 දින සිට එය වසා දැමීමට කටයුතුකර තිබුණි. | වාහන වල තුලට භූගත ජලය කාන්දුවක් සිදුවීම නිසා නැවත අලුත්වැඩියාවක් සිදුකලද එය අසාර්ථක බැවින් වාහන වල වසා දමන ලද බව. | ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර රජයේ මුදල් අරපිරිමැසුම්දායීව යෙදවීමට කටයුතු කල යුතුය. |

**3.5 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රත්මලාන කාර්මික විද්‍යාලයේ 2022 වර්ෂයේ අගෝස්තු හා සැප්තැම්බර් මාසවල ප්‍රතීතනය අවසන් වන පාඨමාලා 04 ක් හා 07 ක් ප්‍රතීතනය කරන ලෙස තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් ඉල්ලීම් කර තිබුණද 2022 නොවැම්බර් 15 දින වන විටත් ප්‍රතීතනය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබූ බව. | පවත්වනු ලබන පාඨමාලා සඳහා ප්‍රතීතන සහතික ලබා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | හෝමාගම කාර්මික විද්‍යාලයේ 2021 වර්ෂයේදී බාහිර දේශකවරු 15 දෙනෙකු විසින් ආවරණය කල යුතු පැය ගණන ආවරණය කිරීමේ ප්‍රතිශතය සියයට 5 සිට සියයට 75 අතර පරාසයක පැවතුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | බාහිර දේශකවරුන්ගේ කාර්ය භාරය පිළිබඳ නිසි අධීක්ෂණයක් තිබිය යුතුය. |
| (ඇ) | විද්‍යාල 11 ක පාඨමාලා පැවැත්වීම පිළිබඳ පරීක්ෂාවේදී 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල විද්‍යාල වලට බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව ක්‍රමික පහළ යාමක් පැවතීම, පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය සියයට 25 සිට සියයට 46 අතර ඉහළ මට්ටමක පැවතීම, බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව සියයට 75ට වඩා ක්‍රමිකව අඩුවෙමින් පැවතීම, විභාග වලට පෙනීසිටින ශිෂ්‍ය සංඛ්‍යාවත් විභාග සමත් ශිෂ්‍ය සංඛ්‍යාවත් සියයට 70 ට වඩා අඩුවූ අවස්ථා පැවතීම, ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 03කට වඩා වැඩි කාලයක් ගෙන තිබීම, යන තත්වයන් නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | විද්‍යාලවල පවතින කාර්ය සාධන මට්ටම ඉහල නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | තාක්ෂණ/කාර්මික විද්‍යාල 39 හි අධ්‍යන අංශයේ පුරප්පාඩු 780 ක් දීර්ඝකාලීනව පැවතීම හේතුවෙන් ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව පහල යාමට, විභාග සඳහා පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අඩු වීමට, විභාග සමත්වන ශිෂ්‍ය සංඛ්‍යාව පහල යාමට, පාඨමාලා හැර යන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි වීමට, ශ්‍රම වෙළඳපොළට නිපුණතාවයකින් යුතු ශ්‍රම බලකායක් ලබා දීමේ හැකියාව හීන වීමට හේතු විය හැකි බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොතිබුණි. | විද්‍යාලවල පවතින කාර්ය සාධන මට්ටම ඉහල නංවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | දෙපාර්තමේන්තුවේ පිහිටි ගොඩනැගිල්ලක දෙවන මහලේ අංක 07 දරන දේශන ශාලාව වසර ගණනාවක සිට පරිපාලන අංශයේ ගබඩාවක් ලෙස භාවිතා කරන අතර කාර්යාලයක් සඳහා වෙන්කර ඇති වර්ග අඩි 450 ක පමණ ප්‍රමාණයකින් යුතු කාමර 02ක් කිසිදු කාර්යයක් සඳහා භාවිතයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි. | දේශන ශාලා අංක 07 අවශ්‍ය අවස්ථාවලදී භාවිතයට ගනු ලබන අයිතම් බොහොමයක් ගබඩා කර ඇති බව. | පවතින සම්පත් අදාල අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් ඵලදායීව ප්‍රයෝජනයට ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | NVQ Level 05 - Diploma in Food technology පාඨමාලාවේ semester 1 ට අදාලව 2022 අගෝස්තු මාසයේ පැවති ලිඛිත විභාගයට සිසුන් 90 දෙනෙකු සඳහා එක් විෂයයක් වෙනුවෙන් පෙර දින පැවති විෂයයකට අදාල ප්‍රශ්න පත්‍රයක් ලබාදී තිබුණි. පසුව නිවැරදි ප්‍රශ්න පත්‍රය විභාග අංශය මගින් විද්‍යුත් තැපැල (Email) මාර්ගයෙන් ලබා දීමට කටයුතු කර තිබුණි.<br><br>ජාත්‍යන්තරව උසස් පිළිගැනීමකින් යුතු කාර්මික අධ්‍යාපනය හා පුහුණුව ලබාදීමේ ප්‍රමුඛයා වීම යන දැක්මෙන් යුතුව කටයුතු කරන දෙපාර්තමේන්තුවක් ලෙස නොසැලකිලිමත් ලෙස කටයුතු කිරීම තුලින් ඇතිවන මෙවැනි සිදුවීම් මගින් විභාගයන්හි රහස්‍යභාවය හා විශ්වාසනීයත්වයට දැඩි හානියක් සිදුවන බව විගණනයේදී අනාවරණය විය . | NVQ 5/6 ලිඛිත විභාග වසරකට සිව් වරක් පැවැත්වෙන අතර, විෂයයන් 450 කට පමණ අදාළ ප්‍රශ්න පත්‍ර මුද්‍රණයට යොමුවන බැවින්, අධීක්ෂණයේ අතපසුවීමක් සිදු වී ඇති අතර, නැවත මෙවැනි දූර්වලතා ඇති නොවීමට වගබලා ගන්නා බව. | විභාග අංශයේ රාජකාරි කටයුතු නිසි අධීක්ෂණයකින් හා රහස්‍යභාවයකින් යුක්තව සිදුවිය යුතුය. |
| (උ) | දෙපාර්තමේන්තුව තුල පවතින වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති 04 විධිමත්ව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් නිලධාරීන් 91 දෙනෙකු වසර ගණනාවක සිට එකම ස්ථානයක රැඳී සිටින බව විගණනයේදී අනාවරණය විය. | නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන සිය පුද්ගලික අපහසුතා මත කරනු ලබන ඉල්ලීම් පිළිබඳ සානුකම්පිතව සලකා බලා මෙම නිලධාරීන් තවදුරටත් දෙපාර්තමේන්තුව තුල රැඳී සිටීමට අවස්ථාව ලබා දී ඇති බව. | ස්ථාන මාරු ප්‍රතිපත්ති විධිවිධාන හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුව හා ඒ යටතේ ක්‍රියාත්මක වන තාක්ෂණ/කාර්මික විද්‍යාල සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද තනතුරු 51 ක පුරප්පාඩු 1599 ක්ද තනතුරු දෙකක අතිරික්තතා 42 ක්ද පැවතුණි. | රජයේ නීතිරීති හා ප්‍රතිපත්තිවලට අනුකූලව ඉදිරියේ දී පුරප්පාඩු පිරවීමට කටයුතු කරන අතර දැනට තිබෙන මානව සම්පත් කළමනාකරණය කිරීම තුළින් හැකි උපරිම ආකාරයෙන් අදාළ සේවා සපුරාලීම සඳහා ක්‍රියාකර ඇති බව. | පුරප්පාඩු සඳහා නිසි ක්‍රමවේදයක් යටතේ බඳවාගැනීමටත් අතිරික්ත තනතුරුවල සිටින නිලධාරීන් පුරප්පාඩු පවතින ආයතන වෙත යොමු කිරීමටත් කටයුතු කල යුතුය. |